# බලන්ගොඩ නගර සභාව

## 2026 වර්ෂය සඳහා සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම.

2026 වර්ෂයට පහත දැක්වෙන සැපයුම් හා සේවාවන් සඳහා සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමට 2025-11-30 දින දක්වා අයදුම්පත් බලන්ගොඩ නගර සභාවේ සභාපති වන මා විසින් කැඳවනු ලැබේ. සැපයුම්කරුවෙකු හෝ කොන්ත්‍රාත්කරුවෙකු වශයෙන් ලියාපදිංචි වීමේදී පහත සඳහන් පරිදි ගාස්තු අයකරනු ලබන අතර අදාළ ගාස්තු ගෙවමින් එක් අයෙකුට කාණ්ඩ කිහිපයක් යටතේ වුවද ලියාපදිංචි විය හැකිය.

| අනු අංකය | කාණ්ඩය | ලියාපදිංචි ගාස්තුව |
|---|---|---|
| | | රුපියල් |
| 01. | කාර්යාල උපකරණ හා ලිපි ද්‍රව්‍ය | 1000.00 |
| 02. | වානේ ගෘහ භාණ්ඩ හා ලී බඩු | 1000.00 |
| 03. | පරිගණක, පරිගණක උපාංග හා මුද්‍රණ තීන්ත, CD තැටි, ටෝනර්, කාර්ට්රිජ්, රිබන්, පරිගණක මෘදුකාංග | 1000.00 |
| 04. | ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍ය | 1000.00 |
| 05. | මාර්ග නඩත්තු උපකරණ හා ද්‍රව්‍ය<br>6×9, 6×4, 4×4, 4×2, 2×2, 1 1/2, 1, 3/4, 1/2 ප්‍රමාණයේ කළුගල්, ගල් කුඩු, ABC, සියලුම ජල සැපයුම් පයිප්ප හා උපාංග, හියුම් පයිප්ප, කොන්ක්‍රීට් නිෂ්පාදන, ගංගා වැලි | 1000.00 |
| 06. | නාම පුවරු, දැන්වීම් හා සමරු ඵලක, බැනර්, කටවුට්, ඩිජිටල් පෝස්ටර් ආදිය | 1000.00 |
| 07. | ක්‍රීඩා භාණ්ඩ, ළදරු පාසල් උපකරණ | 1000.00 |
| 08. | තීන්ත වර්ග ( එනමල්, ඉමල්ෂන්, මළ නිවාරණ තීන්ත) | 1000.00 |
| 09. | විදුලි උපකරණ ( විදුලි පහන් ඇතුළු සියලු විදුලි අයිතමයන්) | 1000.00 |
| 10. | මුද්‍රණ කටයුතු හා රබර් මුද්‍රා නිෂ්පාදන, මුද්‍රිත පෝරම | 1000.00 |
| 11. | කාර්යාල උපකරණ අලුත්වැඩියාව (යතුරුලියන, ඡායා පිටපත් යන්ත්‍ර, රෝනියෝ යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, වේලා සටහන් යන්ත්‍ර, පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර ආදී අනිකුත් යන්ත්‍ර | 1000.00 |
| 12. | වාහන සේවා/අලුත්වැඩියා, වාහන අමතර කොටස් (ටයර්, ටියුබ්, බැටරි ඇතුළු අනෙකුත් අමතර කොටස්) | 1000.00 |
| 13. | කුලී පදනම මත ගල් වැලි ප්‍රවාහනය සඳහා ටිපර් රථ සැපයීම. | 1000.00 |
| 14. | සෞඛ්‍යය උපකරණ හා විෂබීජ නාශක ද්‍රව්‍ය (සබන්, කුණු ඉවත් කිරීමේ ද්‍රව්‍ය) | 1000.00 |
| 15. | පිඟන් භාණ්ඩ | 1000.00 |
| 16. | පුස්තකාල පොත් | 1000.00 |
| 17. | නිළ ඇඳුම් සඳහා රෙදි සැපයීම. | 1000.00 |
| 18. | ශ්‍රව්‍ය උපකරණ, දෘශ්‍ය උපකරණ, පටිගත කිරීම් උපකරණ ආදිය සැපයීම. | 1000.00 |
| 19. | පරිභෝජන භාණ්ඩ, වියළි සහ අනිකුත් ආහාර ද්‍රව්‍ය සැපයීම. | 1000.00 |
| 20 | ඉහත සඳහන් නොවුණු වෙනත් අයිතමයන් (සඳහන් කරන්න) | 1000.00 |

**කොන්ත්‍රාත්කරුවන්**

| අනු අංකය | කාණ්ඩය | ලියාපදිංචි ගාස්තුව |
|---|---|---|
| | | රුපියල් |
| 01. | රු. 100,000/- දක්වා | 1000.00 |
| 02. | රු. 100,000/- සිට 250,000 දක්වා | 1500.00 |
| 03. | රු. 250,000 සිට රු. 500,000/- දක්වා | 1750.00 |
| 04. | රු. 500,000/- සිට 1,000,000 දක්වා | 2000.00 |
| 05. | රු. 1,000,000/- ට වැඩි | 2500.00 |

**කොන්දේසි**

01. සැපයුම්කරුවන්, සේවා සපයන්නන් හා කොන්ත්‍රාත්කරුවන් ලෙස ලියාපදිංචි වීමට අපේක්ෂා කරන පුද්ගලයන් විසින් බලන්ගොඩ නගර සභා නිල වෙබ් අඩවියේ පළකර ඇති ආදර්ශ අයදුම්පත්‍රය හෝ ඒ අයුරින් සකස් කළ අයදුම්පත්‍රයක් මඟින් 2025.11.30 දිනට පෙර "සභාපති/ලේකම්, නගර සභාව, බලන්ගොඩ" ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය හැකිය.

02. ලියාපදිංචි ගාස්තුව 2025.11.30 දිනට පෙර ලැබෙන සේ, චෙක්පතක් හෝ මුදල් ඇණවුමක් එවීමෙන් හෝ නගර සභාව වෙත මුදලින් ගෙවීමෙන් 2026 වර්ෂය සඳහා ලියාපදිංචි විය හැකිය.

03. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහල කෙළවර "සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම 2026" යනුවෙන් සඳහන් කළ යුතුය.

04. සභාවේ අවශ්‍යතාවය පරිදි ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිළ ගණන් කැඳවන අතර, සේවා අවශ්‍යතාවය මත ඉන් බාහිරවද භාණ්ඩ හා සේවා සපයා ගැනීමේ අයිතිය මෙම සභාව සතුය.

05. මීට අමතරව රජය විසින් කලින් කලට පනවනු ලබන බදු හා ගාස්තුන් ද අදාළ වේ.

06. වැඩිදුර විස්තර කාර්යාලයීය දුරකතන අංක 045-4930830 විමසීමෙන් හෝ www.balangoda.uc.gov.lk කාර්යාලයීය නිල වෙබ් අඩවියට පිවිසීමෙන් ලබා ගත හැකිය.

2025.10.30 වන දින
බළන්ගොඩ නගර සභාවේ දීය.

කේ.ජී. පේමදාස
සභාපති
බළන්ගොඩ නගර සභාව.

## 2026 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා

### අයදුම්පත්‍රය

**ලියාපදිංචි වීමට අපේක්ෂිත අයිතමය/ අයිතමයන් ............................................ව්‍යාපාරය පිළිබඳ තොරතුරු**

01. පුද්ගල/ව්‍යාපාරනාමය.................................................................................................................
02. පුද්ගල/ව්‍යාපාර ලිපිනය.................................................................................................................
03. පුද්ගල/ව්‍යාපාරයේ ලියාපදිංචි අංකය.................................................................................................
04. පුද්ගල/ව්‍යාපාරයේ දුරකථන අංකය : ...............................................................................................
05. පුද්ගල/ව්‍යාපාරයේ ෆැක්ස් අංකය :.................................................................................................
06. පුද්ගල/ව්‍යාපාරයේ ඊ-මේල් ලිපිනය : ...............................................................................................
07. ව්‍යාපාර හිමිකරුගේ නම : ............................................................................................................
08. ව්‍යාපාර හිමිකරුගේ හෝ පහසුවෙන් සම්බන්ධ කර ගත හැකි අයෙකුගේ ජංගම දුරකථන අංකය :
    ........................................................................................................................................
09. භාණ්ඩ හා සේවා සැපයීම පිළිබඳ පළපුරුද්ද :......................................................................................
10. ණය පදනම මත භාණ්ඩ හා සේවා සැපයීමට හැකියාව ඇතිද නැතිද යන්න පිළිබඳව සඳහන් කරන්න.
    ........................................................................................................................................
11. එසේ ණය පදනම මත භාණ්ඩ හා සේවා සැපයීමට හැකිනම් කොපමණ කාලයකටද?
    ........................................................................................................................................

**ලියාපදිංචි ගාස්තු ගෙවීම පිළිබඳ තොරතුරු**

චෙක්පත්/ මුදල් ඇණවුම් අංකය :

.......................................................................................................................

මුදල ශ්‍රී ලංකා රුපියල් :

.....................................................................................................................................

දිනය :

..................................................................................................................................................

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. බළන්ගොඩ නගර සභාවේ 2026 වර්ෂයේ භාණ්ඩ හා සේවා සැපයුම්කරුවෙක්/ කොන්ත්‍රාත්කරුවෙක් වශයෙන් ලියාපදිංචි කර ගන්නා මෙන් කාරුණිකව ඉල්ලමි.

දිනය :

අත්සන :

ව්‍යාපාරික නිළමුද්‍රාව :